**www.wsws.org**

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඕස්ට්‍රේලියාවේ ඇබොරිජින්වරුන්ගේ ලෙන් සිතුවම් පිලිබඳ ප්‍රබල සොයාගැනීමක්

A major discovery of Aboriginal cave paintings in Australia

**සුසන් ඇලන් විසිනි**
**2003 අගෝස්තු 05**

ඕස්ට්‍රේලියානු කෞතුකාගාරයේ පුරාවිද්‍යාඥයින් හා විද්‍යාඥයින් පිරිසක් සිඩ්නිහි ද්වාර පාමුල යන වචනාර්ථය සහිත ඊගල්ස් රීච් ප්‍රදේශයෙන් වසර 4,000ක් පැරනි ඇබොරිජියානු ලෙන් සිත්තම් අඩවියක් පසුගිය මැයි මාසයේ දී අනාවරනය කලහ. ප්‍රදේශයේ බොහෝ ලෙන් සිතුවම් අඩවි තිබිය දීත්, සිඩ්නි නගරයට වයඹ දිගින් කිලෝ මීටර 160ක් පමන දුරින් පවතින වොලොමි ජාතික උද්‍යානයේ වනගහන කොටසේ පිහිටා ඇති ඊගල්ස් රීච්හි සොයා ගැනීම පසු ගිය වසර 50 තුල කෙරුනු වඩාත් පෘථුල හා අර්ථභාරී ගවේෂනය ලෙස සැලකිය හැකි ය. ප්‍රදේශයේ, වාසයට නුසුදුසු කර්කෂ භූමි ස්වභාවය හේතුවෙන්, සැඟවී පැවති අඩවිය තුල දෙසියයකට වැඩි මැනවින් සුරක්ෂිත අගනා රූප බොහොමයකි.

අඩවිය පිහිටි තැන ප්‍රථමයෙන් සොයා ගත්තේ 1995 දී වනසංචාරක කන්ඩායමක් විසිනි. විශාල පර්වතාවරනයක බෑවුම ලනුවක ආධාරයෙන් බසින විට ඔවුනට අහම්බෙන් ලෙන් සිතුවම් හමු වී තිබේ. ඔවුන් මෙම සොයා ගැනීම පිලිබඳ ව නිව් සවුත් වේල්ස් ජාතික උද්‍යානය හා වනජීවී සේවයට වාර්තා කල අතර පුරා විද්‍යාඥයින් කන්ඩායමක්, ලෙන් සිතුවම් විශේෂඥයින් හා පලාත්බද ඩාර්තින්ගුන්ග්, ඔරුග් සහ විරාඩ් ජූරි ගෝත්‍රවල ඇබොරිජින්වරු සමග විද්‍යාත්මක පරීක්ෂනයක් ආරම්භ කිරීමට පෙර එය තවත් වසර අටක් ගත කලේ ය. ගංවතුර හා ලැව් ගිනි වැනි පාරිසරික සාධකයන් හේතුවෙන් සහ අඩවියේ වැදගත්කම පිලිබඳ ආරම්භක අවතක්සේරුව හේතුවෙන් පමාව සිදුවිය.

ඕස්ට්‍රේලියානු කෞතුකාගාරයේ ප්‍රධාන මානව විද්‍යාඥ ආචාර්ය පෝල් ටැකොන් විසින් ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ: එය "හරියට කාලයට අමතකව ගිය පුරාතන ලෝකයක් වගේ. ස්ථරයන් කීපයක පවතින මෙබඳු දුර්ලභ නිරූපනයන් සමූහයක් අපි කිසි දිනෙක දැක නැත්තෙමු. නිදර්ශනයක් වසයෙන් ලෙන් සිත්තම් ස්ථර කීපයක පවතින පක්ෂීන් සම්බන්ධිත චිත්‍ර නිරූපනයන්ගේ අසාමාන්‍ය විශාල ප්‍රතිශතයක් අපගේ විශ්ලේෂනයන් මගින් හෙලිදරව් කොට තිබේ.

"විශ්වාස කිරීමට අපහසු වන තරමට අප උද්වේගකර වූ කරුන නම් ප්‍රදේශයට ආගිය අය පිලිබඳ දිගු වාර්තාවක් ගුහාව තුලින් හෙලිදරව් වීම ය. මෙම ගුහාව මත සලකුනු තබා යන්නට බොහෝ දුර ගෙවා මෙබඳු කර්කෂ භූමියකට මිනිසුන් නැවත නැවතත් සංචාරය කලේ මන් ද යන්න සිතීමට පවා අපහසු විශ්මයකි."

මීටර 12ක් දිග, මීටර 6ක් ගැඹුරු සහ මීටර 1 සිට 2 දක්වා උස්වන ගුහා ගර්බය තුල වෙන් වෙන් ව චිත්‍ර 203ක් අඩංගු අතර අඟුරු, සුදු මකුලු මැටි, කහ සහ රතු හිරිගල් මාධ්‍ය ඇසුරින් සිත්තම් හා විවිධ සටහන් නිර්මානය කොට ඇත. ඇබොරිජිනියානු පරම්පරා ගනනාවක කලා හා සංස්කෘතික හැකියාව විදහා දක්වමින්, එක් වර්ගයක් මත තවෙකක් තබා ඉස්මතු කරනු ලබන රූප අඩුම තරමේ ස්ථර 12කවත් තිබේ. නානාවිධ පක්ෂීන්, උරග වර්ගයේ සතුන්, කැන්ගරුන්, වොලබීස් හා ගොන්නෑස් වැනි චර්මකෝෂ සහිත සතුන්, පත්‍ර වලිගැති හූනන් වැනි ප්‍රදේශයේ වෙසෙන නොයෙක් සතුන් චිත්‍රනය කොට ඇත. ඉතා සියුම් ව ඇඳ ඇති රාජාලියෙකුගේ කාය ප්‍රමානයැති චිත්‍ර හා අතිශයින් ම දුර්ලභ රටා සහිත වොම්බැට් (ඕස්ට්‍රේලියාවේ වෙසෙන සත්ත්ව විශේෂයන්) සතෙකුගේ චිත්‍රයක් ද මීට ඇතුලත් ය.

ඊගල්ස් රීච්හි සොයා ගැනීම කරුනු කීපයක් නිසා වැදගත් වන අයුරු ආචාර්ය ටැකොන් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* කියා සිටියේ ය: "ප්‍රධාන නගරයක අද්දර පිහිටි දුර්ලභ චිත්‍ර බොහෝමයක් සහිත මෙබඳු අඩවියක් ලෝකයේ වෙන කොතැනකවත් නැත. වෙනත් රටවලින් පවා එබඳු අඩවියක් සොයා ගැනීම බෙහෙවින් අසීරු ය. 1800 ගනන්වල කාල පරිච්ඡේදය ඕස්ට්‍රේලියාවේ ගවේෂනයේ යුගයක් ලෙස සිතීමට අප නැඹුරු වී සිටි නමුත් සොයා ගැනීමට, හඳුනා ගැනීමට හා සලකුනු කිරීමට වටිනා නිධානයන් තවත් තිබේ. චිත්‍ර තවමත් වෙනස් නො වූ තත්වයක පවතී. හරියට ඔවුන් ඊයේ ඇන්ද ඒවා වගෙයි."

බොහෝ ලෙන් ආවරන පැති තුනකින් විවෘත වී පැවතුන ද ඊගල් ලෙන් අඩවිය උතුරට මුහුන ලා එක් පැත්තකට පමනක් විවර ව පිහිටා ඇත. උතුරු දෙසට නෙරා තිබෙන පර්වතය අව්වැසි සුලං ආදී කාලගුනික

බලපෑම්වලින් චිත්‍ර මනා ලෙස සුරක්ෂිත කිරීමට ඉවහල් වී තිබේ. ටැකොන් පැවසූ ලෙසට ගවේෂනයේ අනෙක් වැදගත් සංරචකය වන්නේ "මානවසත්වයුග්ම" (තෙරියන්ත්‍රෝපස්) නමින් හඳුන්වනු ලබන අර්ධ මානව හා අර්ධ සත්ව හැඩයෙන් නිර්මානය කරන චිත්‍ර ගනයට අයත් රූප පැවතීම ය. කැන්ගරුන්ගේ ශරීරවලට පක්ෂීන්ගේ හිස් යොදා නිර්මානය කල දුර්ලභ චිත්‍ර මෙහි තිබේ. මීට සමාන කැන්ගරු රූපයක් ඊගල්ස් රීච්වලට නුදුරු නැගෙනහිරින් වන හොව්කෙස්බුරි නදිය අසල අඩවියකින් සොයා ගනු ලැබ තිබේ.

ටැකොන් මෙසේ ද විස්තර කලේ ය: "මෙම මානව-සත්ව රූප ඕස්ට්‍රේලියාව තුල ද, එතෙර කලාප කීපයක් තුල ද සොයා ගැනුනු අති විශේෂ චිත්‍රමය නිරූපනයන් වන අතර, සිඩ්නි ප්‍රදේශයෙන් හමුවුනු කුරුලු හිස් සහිත නිර්මාන ඉතා දුර්ලභ සොයා ගැනීමකි. ඊජිප්තුවේ දී එවැනි සත්ව හිස් සහිත හැඩයන්ගෙන් නිරූපිත වන්නේ දෙවියන් ය."

ඇබොරිජිනියානු ආගමික විශ්වාසයන්ට අනුව, මෙම මිශ්‍රිත රූපවලින් සමහරක් තම පූර්වජයන්ගේ වන අතර ඒවා මිථ්‍යමන්ත අවධියේ සිට ම පර්වත බිත්ති මත විද්‍යාමාන වේ. මෙම විශ්වාස පද්ධතිය යටතේ, මානවයන් විසින් මෙම සිත්තම් නො කල අතර, පූර්වජයන්ගේ ආත්මයන් පිටත සැරිසරන අතර පූර්වජයන් බිත්ති මත පදිංචිවීමෙන් මෙම රූප නිමැවී ඇත.

ඇබොරිජින්වරුන්ට ලෙනෙහි පවතින වැදගත්කම පිලිබඳ ව විස්තර කරමින් ටැකොන් කියා සිටියේ: "උතුරෙන්, දකුනෙන් හා බටහිරින් එක්ව පැමිනි විවිධ භාෂා කන්ඩායම් ද අන්තර්ගත ඇබොරිජිනියානු ජනතාව සඳහා මෙය සුවිශේෂ ස්ථානයක් වූවා විය හැකි ය."

වසර කීපයකට ඉහත දී, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ පුරා විද්‍යා හා මානව විද්‍යා කෞතුකාගාරයේ ක්‍රිස්ටෝපර් චිපින්ඩාල් සහ ටැකොන් විසින් උතුරු දිග ඕස්ට්‍රේලියාව, යුරෝපය හා දකුනු අප්‍රිකාව මුලුල්ලේ කෙරුනු ප්‍රාග් ඓතිහාසික "මානවසත්වයුග්ම" රූප පිලිබඳ ප්‍රථම ජාත්‍යන්තර සමීක්ෂනය මෙහෙයවන ලදි. සමීක්ෂනයට බඳුන් වූ 5000කට ආසන්න ලෙන් සිතුවම් ආදර්ශනයන් අතුරින් "මානව සත්ව යුග්ම" රූප හමු වී ඇත්තේ සියයට 1 සිට 4 දක්වා වූ ප්‍රතිශතයක් පමනි.

ඊගල්ස් රීච්හි ලෙන් සිත්තම් තුල දැත්, ආයුධ, පුරාතන බූමරංග හා කෙටේරි මිටවල්වල කටහන් අඩංගු වන අතර ඇතැම් විට ඒවා නිර්මානය කරනු ලැබුවේ මුඛයට ගත් හිරියල් සායම් වස්තුව වටා ඉසීමෙන් විය හැකි ය. කටහන් කරන ලද අත්වල රූප ඊගල්ස් රීච්හි පැරනිතම චිත්‍ර අතරට අයත් වන එනම් වසර 2000ත් 4000ත් අතර පැරනි ඒවා ය. ලෙන් බිම මත තිබී හමු වී ඇති අඟුරු හා ගල් ආයුධ තවදුරටත් විද්‍යාත්මක ගවේෂනයක අවශ්‍යතාව මතුකර ඇත.

ලෙන් හා පර්වත සිතුවම්, සියලු ඇබොරිජිනියානු කලාවන් මෙන් ම වසර 50,000කට ඉපැරනි ඇබොරිජිනියානු සමාජයෙන් හා සංස්කෘතියෙන් වෙන් කල නො හැකි ය. ලිඛිත භාෂාවක් ඇබොරිජිනියානු ජනයා වර්ධනය නො කල ද ඔවුන්ගේ ආගම, නීති හා ඉතිහාසය සන්නිවේදනය කරනු ලැබුවේ ගීත, කාව්‍ය, සිතුවම් හා කැටයම් මගිනි. ශරීර විචිත්‍රකරනය, ගීත, නර්තන හා කතන්දර කීම බඳු විවිධ කලා ආකෘතීන් වෙන් වූ භාවිතයන් නො වූ අතර ඒවා උත්සව අවස්ථාවල රඟදැක්වීම් තුලට ඒකාග්‍රිත වී තිබුනි. කලාව සරලව ම විනෝදය හෝ ස්වයං ප්‍රකාශනය සඳහා නො ව අදහස් හා වටිනාකම් හුවමාරු කර ගැනීම ආදියෙන් සමන්විත සංකීර්න සමාජ අර්ථහාරයකින් යුතු වූවකි.

ලෙන් සිතුවම්වල අර්ථය හා අභිප්‍රාය සංකීර්න හා විසදෘෂ වූවකි. ඇතැම් චිත්‍ර මගින් මිථ්‍යාමය කතාන්දර, අනවින, සශ්‍රීකත්වය හා මලවුන් උදෙසා පුදපූජා වාර්තා වන අතර අනෙක් ඒවායින් දඩයම් කිරීම නිරූපනය වේ. එමෙන් ම එක්තරා විශේෂ සතෙක් චිත්‍රනය කිරීමෙන් එම වර්ගයා බෝවීම උත්තේජනය කරනු ඇතැයි ද පුදපූජා විධි ඇතුලත් චිත්‍ර නිරූපනයන් තුලින් හා ඒවා ස්පර්ශ කිරීමෙන් ශුද්ධ වූ ශක්තිය හා බලය මුදා හැරෙනු ඇතැ යි යන විශ්වාසය හා එය බැඳී තිබේ.

19 වන සියවසේ අවසාන භාගයේ දී රුසියානු මාක්ස්වාදී ජෝර්ජ් ප්ලෙකානව් විග්‍රහ කල ලෙසට ඕස්ට්‍රේලියානු ඇබොරිජිනියානුවරුන්ගේ කලා හා ඇදහීම් ව්‍යුහයන් තේරුම් ගත හැක්කේ දඩයම් හා එලවැල නෙලීමෙන් යුක්ත ඔවුන්ගේ ජීවන පැවැත්මේ ඵලයක් ලෙස පමනි. ඇබොරිජින්වරු, ප්‍රාග්තන යුරෝපීය දඩයක්කරුවන් හා යැකම්රිස්ගි එස්කිමෝවරුන් අප්‍රිකාවේ කෘෂිකාර්මික ජනයා සමග සන්සන්දනය කිරීමේ දී චිත්‍ර ඇඳීම සඳහා බලසම්පන්න පෙලඹවීමක් අත්කරගත්තේ කෙසේ ද යන්න 1899-1900 දී ප්‍රාග්තන සංස්කෘතිය හා කලාව ගැන ලිපි මාලාවක් ලියමින් ප්ලෙකානව් විග්‍රහ කරනු ලැබී ය.

ප්‍රාග්තන මිනිසා දඩයක්කරුවෙක් ලෙස පැවැතුනු තාක් දුරට චිත්‍ර ශිල්පියෙක් හා මූර්ති ශිල්පියෙක් ලෙසට අනෙක් දේවල් අතරේ ඔහු තමාව ම අනුකරනය කිරීමේ නැඹුරුවක් පවතී. හේතුව ප්‍රත්‍යක්ෂ ය. චිත්‍ර ශිල්පියෙක් ලෙස ඔහුට අවශ්‍ය වූයේ කුමක් ද? නිරීක්ෂනයේ බලය හා දෑතෙහි නිපුනතාව යි. මේවා දඩයක්කරුවෙකු ලෙස ඔහුට අවශ්‍ය ගුනාංගයන් ය. එබැවින් ඔහුගේ කලාත්මක ක්‍රියාකාරකම් පැවැත්ම සඳහා ඔහු යෙදී සිටි අරගලය තුල දී හැඩ ගැසෙන ඉහලතම තත්වයන්ගේ ප්‍රකාශනයකි. සත්ව පාලනය හා කෘෂිකර්මයට සංක්‍රමනය වීමත් සමග පැවැත්ම සඳහා ඔහු යෙදී සිටි අරගලයේ කොන්දේසි වෙනස් කෙරුනි. ප්‍රාග්තන මිනිසා, දඩයම් යුගයෙන් ඔහු හිමිකරගත් විශිෂ්ට චිත්‍රනය කිරීමේ හැකියාව හා නැඹුරුව විශාල වසයෙන් අහිමි කර ගත්තේ ය." (ජෝර්ජ් ප්ලෙකානව්, *තෝරාගත් දාර්ශනික කෘති, 5 වන වෙලුම* - ප්‍රගති ප්‍රකාශන, මොස්කව්. 1976, 358 පි).

කලාකරුවා හා දඩයක්කරු අතර සමීප හා අභේද්‍ය සම්බන්ධතාව පැහැදිලි කරන ප්ලෙකානව්ගේ විද්‍යාත්මක විශ්ලේෂනය, ලෝකයේ ඇතැම් පැරනිතම ලෙන් සිත්තම්වල නිපුනතාවේ සියුම් බව, තාක්ෂනයේ ලාලිත්‍යය, තාත්ත්විකත්වය හා සෞන්දර්යයාත්මක ශෝභාව මගින් බොහෝ කලා විශේෂඥයින් හා මානව විද්‍යාඥයින් විශ්මයට පත් කරවනු ලැබ ඇත්තේ මන්ද යන්න විදහා දක්වයි. ඇබොරිජිනියානු සමාජය තුල විශේෂ හැකියාවක් ඇති අය ලෙස සැලකුනු සමහරුන් සිටි නමුදු, දඩයමට හා එක්රැස් කිරීමේ කාර්යයන්ට හැමදෙනෙක් ම එකසේ සහභාගි වූහ. සියලු දෙනා ම සංනිවේදනය හා කථාන්තර කීමට ද එම සමාජයේ ආගමික කටයුතුවලට ද සහභාගි වූහ.

## ලෙන් සිත්තම් අඩවි දහස් ගනනක්

ඕස්ට්‍රේලියාවෙන් ලක්ෂයකට අධික ලෙන් සිතුවම් අඩවි සොයා ගනු ලැබ ඇත - එය ලෝකයේ අන් කවර රටකටත් වඩා වැඩි විය හැක - පිල්බරා, කිම්බර්ලේස්, අර්න්හම් බිමෙහි ද උතුරු ඕස්ට්‍රේලියාවේ කේප් යෝක් පලාත්වල ඒවා මේ අතරින් වඩා පොහොසත් හා වර්නවත් වේ.

ඇබොරිජිනියානු කලා හා සංස්කෘතිය පිලිබඳ අධ්‍යයනයක් දැන් වඩා වැදගත් ලෙස සලකනු ලැබුව ද, සැම විට ම එසේ නො විනි. ප්‍රන්ස යටත් විජිත සතුරන්ට එරෙහිව ආසියානු පැසිෆික් කලාපයේ මිලිටරි මුරපොලක් ලෙස ඕස්ට්‍රේලියාව තුල බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය ස්ථාපිත වීමෙන් පසුව ඉක්ම ගිය 18 වන 19 වන සියවස් තුල ඇබොරිජිනියානු ජීවිත හා සංස්කෘතිය පිලිබඳව මානව, විද්‍යාත්මක ගවේෂනයක් කිරීමට ඇල්මක් නො තිබුනු තරම් ය. 1930 ගනන්වල ක්‍රමානුකූල විද්‍යාත්මක ගවේෂනයක් සැබැවින් ම පටන් ගැනුනු, සිඩ්නි විශ්වවිද්‍යාලයේ මානව විද්‍යාත්මක දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කරන තුරු එවැන්නක් සිදු නො විනි.

ඕස්ට්‍රේලියාවේ ලෙන් සිතුවම් අඩවි යුරෝපීයයන්ට ප්‍රථමයෙන් ඇස ගැටුනු දිනවලට ආපසු යද්දී 1605 දී විලියම් ජැන්ස්, 1688 දී විලියම් ඩැම්පියර් හා 1770 දී ජේම්ස් කුක් මුල් ම ගවේෂකයන් ලෙස හැඳින්විය හැකි නමුදු ඔවුන්ගේ නිරීක්ෂනයන් ඉතා ලුහුඬු සහ සීමාසහිත ඒවා විය. කාපෙන්ටෙරිගා බොක්කේ බටහිර දෙසින් වූ ලෙනක මුහුදු ඌරන්, කැස්බෑවන්, කැන්ගරුන් සහ මිනිස් අත්වල සිතුවම් පැවැති බවට 1804 දී මැතිව් ෆ්ලින්ඩර්ස් වාර්තා කර තිබුනි.

බොහෝ ගවේෂකයන් පාෂාන චිත්‍ර, ගොරහැඩි ලෙස නිමවා ඇත යන අර්ථියෙන් “අශීලාචාර” යන වචනය විස්තර කිරීමේදී යොදාගෙන ඇත ද (1842) ඩෙපුච් දිවයින පිලිබඳ සටහන්වල දී කැප්ටන් වික්හැම් වැනි අය දක්වා ඇත්තේ “ඇබොරිජින්වරු නිමවා ඇති සතුන්ගේ හා කුරුල්ලන්ගේ චිත්‍රවල ගැලපීමේ තීක්ෂනභාවය, ඉවසිලිමත් දැරීමේ ශක්තිය, නිපුනත්වය හා නිරීක්ෂන හැකියාව” පිලිබඳව ඔවුන් විශ්මයට පත් වූ බව යි.

19 වන සියවස මැද භාගයේ දී, "ශිෂ්ටකරනය" හා ඇබොරිජින්වරු ක්‍රිස්තියානි ආගමට හරවා ගැනීමේ එල්ලය ඇති ව මිෂනාරීන් කල වැඩ අතර ඇබොරිජිනියානු සමාජය පිලිබඳ අධ්‍යයනයන් ස්වල්පයක් ද වේ. ඇබොරිජිනියානු සංස්කෘතිය ඒ වන විටත් අතුරුදහන් වෙමින් පැවති ගෝත්‍රික ප්‍රදේශවල වැඩ කරමින් ඔවුන් නිරතුරු ව පුරාතන සිරිත් විරිත් පිලිබඳ ව ඇති එක ම ලිඛිත වාර්තා සම්පාදනය කලහ. 1841 දී ජෝර්ජ් ග්‍රේ කිම්බර්ලි ප්‍රදේශයේ වන්දිනා ලෙන් පිලිබඳව ගවේෂනය කරමින් විස්තර වාර්තා කලේ ය. එබඳු උසස් තත්වයකින් ඇබොරිජින්වරු චිත්‍රනය කලේ ය යන්න විශ්වාස කිරීම ග්‍රේ ප්‍රතික්ෂේප කලේ ය.

19 වන සියවස අවසාන වන විට, සීඝ්‍රයෙන් අතුරුදහන් වෙමින් පැවැති ගෝත්‍ර හා ඔවුන්ගේ සංස්කෘතිය පිලිබඳ දත්ත ගොනු කිරීම හා වාර්තා කිරීමට බරපතල ප්‍රයත්නයන් දැරූ අවස්ථා ද වේ. පරීක්ෂකයන් මානව විද්‍යාව පිලිබඳ ව ඇල්මක් දැක් වූ නමුත් ඔව්හු විද්‍යාත්මක පුහුනුවක් ලැබ නො සිටියහ. වික්ටෝරියා හා දකුනු ඕස්ට්‍රේලියාවේ ඇබොරිජින්වරු ගැන රජයේ අනුග්‍රහයෙන් නිකුත් වූ ප්‍රකාශන කීපයක් ඔවුන්ගේ ප්‍රයත්නය උදෙයෝගීමත් කිරීමට ඉවහල් විය.

1894 දී ඉඩම් මිනින්දෝරුවකු වන ආර්.පී. මැතිව්ස් "ඕස්ට්‍රේලියාවේ ඇබොරිජින්වරුන්ගේ පාෂාන රූප" යන මැයෙන් පත්‍රිකාවක් දකුනු ශාන්තිකර දිවයින්වල රාජකීය භූගෝල විද්‍යාත්මක සමාජයේ ඕස්ට්‍රේලියාවේ ක්වින්ස්ලන්ඩ් ශාඛාවට ඉදිරිපත් කලේ ය. ප්‍රාග්තන කලා ගැන ප්ලෙකානව්ගේ ලේඛනවලින් උපුටා දැක්වීම් ද ඇති ව එම ලිපිය, එතෙක් හඳුනාගෙන සිටි නිව්සවුත්වේල්ස්හි පාෂාන කලා ස්ථානයන් පිලිබඳ තොරතුරු සහිත වාර්තාවක් සපයා තිබුනි. ඊට කැටයම් හා චිත්‍ර පිලිබඳ විස්තර ද ඇතුලත් ය. මානව විද්‍යාව පිලිබඳ මහජනතාවගේ අඩු අවධානය සම්බන්ධයෙන් ඔහුගේ කනස්සල්ල ප්‍රකාශ කරමින් ක්‍රමානුකූල මානව විද්‍යාත්මක පර්යේෂනයක් ඉල්ලා මැතිව්ස් හඬ නැගී ය. "මානව විද්‍යාවේ මේ අංශයෙන් තව මත් කෙරී පවතින්නේ ඉතා කුඩා වැඩ කොටසකි" ඔහු ලිවී ය. "එය තව මත් අනාවරනය කර ගැනීමට නියමිත පෘථුල ක්ෂේත්‍රයකි." වහා මෙම කර්තව්‍ය භාර ගත යුතු අතර තව මත් ඒ සඳහා අවකාශයක් පවතිද්දී එක්කෝ එය අසම්පූර්නත්වය නැත හොත් මුලුමනින් ම කල් පමා වී වැඩි බව ඔප්පු කරනු ඇත."

සියලු අඩවිවල ගමන් මාර්ග හා පිහිටීම දක්වන පොදු සිතියමක් හා විස්තර සහිත වාර්තාවක් අවශ්‍ය බවට ඔහු යෝජනා කල අතර තවත් බොහෝ අඩවි මුහුදුබඩ පලාත්වලට නුදුරින් හමුවනු ඇතැයි අනාවැකි පල කලේ ය. "පොදු නියාමයක් ලෙසට වඩාත් සාරවත් හා හොඳ ම ජලාශ සහිත, ආහාරයට සුදුසු ශාක, මාලු හා දඩයමට සතුන් ආදිය බහුල වන්නේ විජිතයේ

මුහුදුබඩ දිස්ත්‍රික්ක තුල ය. කිසියම් ජනතාවකගේ වර්ධනය කෙරෙහි අවට පිහිටි පරිසරයේ සමෘද්ධිමත්භාවය සමග තිබෙන සම්බන්ධතාව නිරීක්ෂනය කෙරී ඇත. ආහාර බහුලත්වය හා නිත්‍ය ජල උල්පත් සමග එහි වෙසෙන්නන්ට ඔවුන්ගේ විශේෂ දක්ෂතාවන් අභ්‍යාසයෙහි යෙදවීමට හෝ අනුකරනය හා අභිනව නිමැවුම් සඳහා වැඩි විවේකයක් ලැබෙනු ඇත."

මැතිව්ස් ඇතුලු තවත් අයගේ වැඩ කටයුතු වහා ම ජාත්‍යන්තර අවධානයක් දිනාගත් අතර අවසානයේ දී 1930 ගනන්වල වෘත්තීය මානව විද්‍යාත්මක සමීක්ෂන සඳහා එයින් පදනම දැමුනි. ඒ.පී. එල්කින්, රොනල්ඩ් එච්. බර්න්ට් හා කැතරින් එම්. බර්න්ඩ්ට් බඳු විශිෂ්ට මානව විද්‍යාඥයෝ 1930 ගනන්වල සිට 1960 ගනන් දක්වා නව විද්‍යාත්මක පදනම් මත වැඩ කටයුතු මෙහෙයවූහ.

1970 ගනන්වල මෙම වැඩ කටයුතු පලල් ලෙස ව්‍යාප්ත වෙමින් මුල දී මැතිව්ස් අනතුරු ඇඟ වූ බරපතල ගවේෂනයක් සඳහා දැවෙන අවශ්‍යතාව එල දරන්නට පටන් ගැනුනි. හඳුනාගත් විශේෂ අඩවිවල වැදගත්කම හා ලෙන් සිත්තම්වල ගැඹුරු අභිප්‍රායන් තුලට යොමු කෙරුනු මානව විද්‍යාත්මක ගවේෂනවල දී සිරිත් විරිත් හා දෘෂ්‍යමය සංකේතයන්ගෙන් ව්‍යුත්පන්න සම්ප්‍රදායික ඥානය තේරුම් ගැනීම පිනිස ප්‍රාදේශීය ඇබොරිජින්වරුන්ගේ ක්‍රියාකාරී සහාය අවශ්‍ය කෙරුනි.

තම සම්ප්‍රදායික ඉඩම් වොලොමි ජාතික උද්‍යානය මගින් වටලන ලද ඩාර්කින්ගුන්ග් හා ඩාරුග් ප්‍රදේශවල ජනයා ඊගල්ස් රීච් අඩවියේ ගවේෂනයන් සඳහා ඉතා සමීපව සහභාගි වූහ. නමුත් පරම්පරා ගනනාවකට ඉහත, යුරෝපීය පදිංචිකරුවන් විසින් ඔවුන්ගේ මුතුන් මිත්තන්ව මෙම ප්‍රදේශයෙන් පලවා හරිනු ලැබිනි.

1800 ගනන් මුල දී, බ්‍රිතාන්‍යය ඇබොරිජිනියානු ජනයා ඈතට තල්ලු කරමින් මෙම ඉඩම් වගාබිම් බවට පරිවර්තනය කලේ ය. 1816 දී මැකෝරි ආන්ඩුකාරයා නිවේදනයක් නිකුත් කරමින් ඕනෑම ගොවි බිමක් අවට ඇබොරිජිනියානුවන් හය දෙනෙක් හෝ ඊට වැඩි ගනනක් එක්රැස් වීම වරදක් බව ප්‍රකාශ කලේ ය. යම්හෙයකින් ඇබොරිජිනියන්වරු "හිරිහැරයක්" වනු ඇතැයි නව පදිංචිකරුවන් විශ්වාස කරනු ලැබුවහොත් ඔවුන් පලවා හැරීම සඳහා මිලිටරි ඒකකයක් පලාතට පිටත් කොට යැවුනි. එම වසර අවසානයේ දී සොල්දාදුවෝ ඇබොරිජිනියානු පුරුෂයින්, ස්ත්‍රීන් හා දරුවන් 14 දෙනෙක් මරා දැමුවේ බ්‍රින්ජෙල් පලාතේ ඇබොරිජිනියන්වරු ප්‍රහාරයක් එල්ල කල බවට චෝදනා නගමින් එයට පලිගැනීමක් ලෙසට ය. අනතුරු ඇඟවීමක් ලෙස ඇබොරිජිනියන් මලසිරුරු දෙකක් ගස්වල එල්ලා තැබූහ. 1890 ගනන්වල දී ඇබොරිජිනියානු ආරක්ෂක මන්ඩලයේ ඊනියා පාලනය යටතේ තැබූ ඩාර්කින්ගුන්ග් හා ඩාරුග් ජනයා සිඩ්නිවලට යාබදව පිහිටි සෙක්විල් රීච්හි වෙන්කල කොටසක පදිංචි කරවී ය.

ඊගල්ස් රීච්හි ලෙන් සිත්තම් සොයා ගැනීම නිවේදනය කිරීමෙන් පසුව සතිවල ඕස්ට්‍රේලියානු කෞතුකාගාරයට සම්මුඛ සාකච්ඡාවන් සඳහා කෙරෙන ඉල්ලීම් ගලා එමින් තිබේ. ඇමරිකාවේ පුරා විද්‍යා ආයතනය, සීඑන්එන්, බීබීසී, *සයන්ස්* සඟරාව ද, නිව් *යෝර්ක් ටයිම්ස්*, බ්‍රසීලයේ හා ඉන්දියාවේ මෙන් ම තවත් රටවල මාධ්‍ය මේ අතර වේ. ගවේෂනය නිසා උද්යෝගයට පත් ලොව පුරා ශිෂ්‍යයන් හා සාමාන්‍ය ජනයා වෙතින් වැඩි තොරතුරු ඉල්ලා සිටින විද්‍යුත් තැපැල් ලිපි අනේක සංඛ්‍යාවක් ලැබෙමින් පවතී.

මෙම අවධියේ දී වොලොමි ජාතික උද්‍යානයේ ඊගල්ස් රීච් ලෙන් සිත්තම් පිහිටි නිශ්චිත ස්ථානය රහසක් ව පැවතිය යුත්තේ, උද්වේගජනක නරඹන්නන් අතින්, සිදුවියහැකි හානි වලක්වා ගැනීම සඳහා ය. සිත්තම් හා සටහන්වල පූර්න වාර්තාකරනයකට තවත් අවුරුදු කීපයක් ගතවෙනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර සොයා ගැනීම පිලිබඳ ව ප්‍රසිද්ධ දේශනයක් අගෝස්තු 28 දින කැන්බරාහි ඕස්ට්‍රේලියානු කෞතුකාගාරයේ දී ආචාර්ය ටැකොන් විසින් පවත්වනු ඇත.

© www.wsws.org